www.wsws.org

ලෝක සමාජවාදී වෙබ් අඩවිය

හතර වන ජාත්‍යන්තරයේ ජාත්‍යන්තර කමිටුවේ ප්‍රකාශනය

# ධනයේ උච්චතම ඒකාග්‍රතාවය කරා ඉහල නගින සර්පිලයක් 2003 වසරේදී නිර්මානය වී ඇති බව මෙරිල් ලින්ච් වාර්තාව පෙන්වා දෙයි

**Merrill-Lynch report: concentration of wealth at the top resumed upward spiral in 2003**

**ජේමී චැප්මන් විසිනි**
**2004 ජූනි 22**

ග්‍රහලෝකය පුරා මිලියන සිය ගනනක් ජනතාව ඩොලරයක් හෝ දෙකක් මත දෛනික පැවැත්ම උදෙසා අරගලයේ යෙදී සිටින අතර ධනවතුන්ගේ සහ සුපිරි ධනවතුන්ගේ මට්ටම් අඛන්ඩව වර්ධනය වෙමින් තිබේ.

ඩොලර් මිලියනයකට වැඩි මූල්‍ය වත්කම් හිමි මිනිසුන් ගනන පසු ගිය වර්ෂයේ දී ලොව පුරාම මිලියන 7.7ක් දක්වා වර්ධනය වී ඇත. එය 2002 වසරට වඩා සියයට 7.5ක වර්ධනයකි. ලොව විශාලතම කොටස් තැරැව්කාර සමාගම වන මෙරිල්-ලින්ච්, ව්‍යාපාරික උපදේශක සමාගමක් වන කැප්ජෙමිනි සමග ජූනි 15 දින ඒකාබද්ධව නිකුත්කල වාර්තාවට අනුව මෙම ප්‍රභූ කාන්ඩයේ සමස්ත ධනය 2002 වසරට වඩා සියයට 7.7කින් ඉහල නැගී ඩොලර් ට්‍රිලියන 2.8ක් බවට පත්ව තිබේ.

ඩොලර් මිලියන 30කට වැඩි ද්‍රවශීල වත්කම් හිමි කොටස ‘‘සුපිරි ධනවතුන්’’ලෙස නම් කර ඇති වාර්තාව ඔවුන්ගේ ධනයද ගනන් බලා ඇත. ධනවතුන් සේ ගැනෙන අයගෙන් සියයට දහයක් පමන වූ ලෝක ජනගහනයෙන් සියයට එකකට වඩා අඩු මෙම කාන්ඩයෙහි 7000ක් දෙනා ඩොලර් ට්‍රිලියන 2.8ක වත්කම් හිමි කර ගනියි. පෞද්ගලික නිවාස හිමිකම් වටිනාකම වාර්තාවට ඇතුලත් කර නොතිබුන ද වානිජ්‍ය දේපල ආයෝජන හිමිකම්, භාරකාර මන්ඩල මගින් පාලනය වන දේපල ආයෝජන හිමිකම් ද ඊට ඇතුලත් කර තිබේ. ලෝකයේ බොහෝ ප්‍රදේශවල නිවාස මිල ගනන්වල තියුනු නැගීම සැලකීමට ගත්විට, පෞද්ගලික නිවාසවල ව්‍යාපාරික අගය ඇතුලත් කලේ නම් මෙම ස්ථරයේ වත් පොහොසත් කම බෙහෙවින් වැඩි වනු ඇත.

2003 වසරේ කොටස් වෙලඳපොලවල ඉහල නැගීමේ ප්‍රතිපල වසයෙන් වසරේ මුල් භාගයෙහි ධනවතුන්ගේ ව්‍යාපාර වස්තු හිමිකම් සැලකියයුතු ලෙස වර්ධනය වී ඇති ආකාරය වාර්තාවේ කතුවරුන් විසින් පෙන්වා දෙති.

‘‘නැගී එන වෙලඳපොලවල දී’’ ඉහල නැගීම වඩාත් වේගවත් විය. 2003 වසරේ දී ඉන්දියාවේ ප්‍රමුඛම හුවමාරු මධ්‍යස්ථානය වන මුම්බායිහි දී මෙය සියයට 110ක් විය. බ්‍රසීලයේ සාවෝ පාවුලෝ හුවමාරුවේ වෙලඳපොල ප්‍රාග්ධන යෙදවුම් සියයට 85කින් වර්ධනය විය.

වාර්තාව ප්‍රකාශ කරන පරිදි ‘‘බොහෝ රටවල පුලුල් ජනතාවන් ට යලි පනගැන්වීමේ ක්‍රියාවලියෙහි බලපෑම යන්තම් දැනෙන්නට පටන්ගන්නා විට ඉහත පුද්ගල කාන්ඩය එහි ප්‍රතිපල වසර පුරාම භුක්ති විඳ තිබේ.

වටිනාකම් ආරක්ෂන අරමුදල්, පෞද්ගලික ව්‍යාපාරවස්තු අරමුදල් හා චිත්‍ර, වයින් වැනි පෞරානික භාන්ඩ මිලට ගැනීම් වැනි සාමාන්‍ය ආයෝජකයාට අතිවිඳිය නොහැකි සංකීර්න ආයෝජනයන්වල ධනවතුන්ගේ යෙදවුම් ප්‍රසාරනය වී ඇත. ඔවුන්ගේ වත්කම්වල නිශ්චල දේපල හිමිකම්හි කොටස සියයට දෙකකින් ඉහල නැගී ඇත.

උතුරු ඇමරිකාව සහ යුරෝපය තුල ධනයේ විශාලතම සමුච්චයගතවීම් සිදුවීම් පුදුම සහගත නොවේ. එජ හා කැනඩාවේ මිලින දෙක හමාරක් දෙනා ඩොලර් ට්‍රිලියන 8.5ක වත්කම් පාලනය කරති. උතුරු ඇමරිකාව තුල 2003 වසරේදී ධනවතුන් සංඛ්‍යාව හා වත්කම්වල වටිනාකම යන දෙකොටසම සියයට 13.5කින් වර්ධනය විය. වඩා පුලුල් මහජන පදනමකින් යුත් යුරෝපයේ මිලියන 2.6ක් වන දසලක්ෂපතියන් විසින් ඩොලර් ට්‍රිලියන 8.7ක් වටිනා වත්කම් පාලනය කරති. උතුරු ඇමරිකාවේ සියයට 2.4ක් හා යුරෝපයේ සියයට 3.7ක් වසයෙන් මෙම කාන්ඩයේ සංඛ්‍යාත්මක වර්ධනය ඉතා සෙමෙන් සිදුවේ. ‘‘පෞද්ගලික ධනය ඒකරාශිවීම වලක්වාලන’’ පොදුවේ යුරෝපයෙහි ඇති ‘‘සීමාසහිත ආදායම් බදු ප්‍රතිපත්තීන්’’ ස්පාඤ්ඤය, රුසියාව හා චෙක් සමූහාන්ඩුවේ ‘‘සැලකියයුතු සුවිශේෂතාවන්’’ සමග ගෙන වාර්තාවෙන් පෙන්වා තිබේ.

ඊට පටහැනිව එජ තුල ඉහල ආදායම් මත හා උරුමය මත ‘‘බදු කපා හැරීමට බුෂ් පරිපාලනය ඉහත වසර මුල දී ගත් තීරනයෙන් සැලකිය යුතු වාසි ලැබුවේ ඉහල දල අගයක් ඇති පුද්ගලයන් ය.’’

‘‘රක්ත උෟෂ්නය’’ ලෙස සැලකෙන චීනයේ හා ඉන්දියාවේ 2003 වසරේ දල දේශීය නිෂ්පාදිතයෙහි වර්ධන වේගය පිලිවෙලින් සියයට 9.7ක් හා 7.4ක් විය. මෙ මගින් දසලක්ෂපතියන්ගේ සංඛ්‍යාව ඉන්දියාවේ සියයට 22කින් හා චීනයේ සියයට 12කින් ඉහල දමා ඇත. 2003 වර්ෂාවසානයේ දසලක්ෂපතියන්ගේ සංඛ්‍යාව ඉන්දියාවේ 61,000 වන විට සිය රටෙහි එය 236,000 වන බවට චීනය පුරසාරම් දෙඩී ය. දෙරටෙහි ම ජනගහනය මිලියනය ඉක්මවන තතු තුල මෙම ස්ථරය නියෝජනය කරන්නේ ඉන් අල්ප ප්‍රතිශතයකි.

ඉදිරි සත් වසර සඳහා වර්ධන වේගය සියයට හතක් ලෙස පුරෝකථනය කරන වාර්තාව ධනවතුන් හා සුපිරි ධනවතුන් විසින් ධනය ඒකරාශී කිරීමේ කිසිදු අවසානයක් පෙර දකිනු නො ලැබේ. එජ දසලක්ෂපතියන් හා කෝටිපතියන් වසර 2008 වන විට ඩොලර් ට්‍රිලියන 40.7ක් පාලනය කරනු ඇතැයි කතුවරුන් අනාවැකි පල කලහ.

වාර්තාවට අනුව යමින් කැප්ජෙමිනි නියෝජ්‍ය සභාපති මාධ්‍යයට ප්‍රකාශ කලේ ධනවතුන් අතර දේපල හා ධන පරිත්‍යාග සැලසුම් සේවාවන් මත බදු සඳහා වැඩෙන ඉල්ලුමක් පවතින බවයි. ‘‘බොහෝ සුපිරි ධනවත් පවුල් වසර 100ක සැලසුම් සකස්කරමින් සිටිති. මෙහිදී පවුල් සාමාජිකයන් ව්‍යාපාර අංශ ලෙස සැලකෙන අතර කුටුම්බ මෙහෙවර පිලිබඳ ප්‍රකාශනයන්, පාලන ව්‍යුහයන් හා සන්නිවේදන මග පෙන්වීම් වැනි කටයුතු වෙනුවෙන් උද්යෝගිමත් ව්‍යාපාරික මගපෙන්වීම් සඳහා යොමුවීමක් ඇති බව’’ අල්වි අබාෆ් පැහැදිලි කලේ ය.

වාර්තාවට කර්තෘත්වය දැරූ ආයෝජන උපදේශකයෝ දසලක්ෂපතීන්ගේ වර්ධනය වන සංචිතය තුල නව සේවාවන් විකුනා ගත හැකිවීමෙන් තෘප්තිමත්වන අතර ධනයෙන් වඩවඩාත් විශාල පංගුවක් තමන් වෙත රැස් කර ගත් තුනී තට්ටුවක් හා සිය ජීවන තත්වයන් එකතැන පල්වන හෝ පහල වැටීම අත්විඳිමින් සිටින අති බහුතරයක් වසයෙන් ගෝලීයව සමාජය ධ්‍රැවාන්තගතවන ආකාරය සංඛ්‍යාලේඛනවලින් පෙන්නුම් කරයි.

© www.wsws.org